කැලණිය විශ්වවිද්‍යාලය - 2021
---------------------------------------

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**කැලණිය විශ්වවිද්‍යාලයේ** 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී **විශ්වවිද්‍යාලය** අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කැලණිය විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---

**ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.**

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

---

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.1,582,224,300ක් වූ දේපල පිරියත හා උපකරණ සහ පිරිවැය රු.293,815,186 ක් වූ පුස්තකාල පොත් හා උපාධි ලෝගු සම්පූර්ණයෙන් ක්ෂයකර තිබුණු නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතුකර නොතිබුණි. | මෙම දෝෂය ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු රු140,000,000 ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීම හා මැනීම සිදුකර නොතිබුණි | ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් වන හඳුනාගැනීමේ හා ඉදිරිපත් කිරීම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11ට අනුකූලව සිදු කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධ්‍යයන කටයුතු සඳහා විදේශගතවීමෙන් පසුව 2011 සිට 2019 කාලපරිච්ඡේදය තුළ බැඳුම්කර කඩකළ කථිකාචාර්යවරුන් 04 දෙනෙකුගෙන් එකතුව රු.22,158,260 කින් කිසිදු මුදලක් අයකර නොතිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට කථිකාචාර්යවරුන් 24 දෙනෙකුගෙන් තවදුරටත් අයකර ගත යුතු වටිනාකම රු.166,494,177 ක් විය. | විශ්වවිද්‍යාලීය පාලක සභාවට දන්වා බැඳුම්කර කඩකළ කථිකාචාර්යවරුන්ට දැන්වීමට යම් කාල සීමාවක් ගතවන අතර බැඳුම්කරය ගණනය පිළිබඳ පැහැදිලි කිරීම් අවසන් වූ පසු ගෙවීම් ආරම්භ වේ. | ප්‍රමාදයන්ගෙන් තොරව අයකර ගැනීම් සිදු කළ යුතු අතර හා ගෙවීම් පැහැර හැර ඇති අය සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී විවිධ ණයහිමියන් වෙත නිකුත් කර තිබුණු රු.2,628,608 ක් වූ චෙක්පත් 196 ක් අවලංගු කර තිබුණු නමුත් 2021දෙසැම්බර් 31 දින දක්වාම ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නැවත ගෙවීම් කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් වී ඇති චෙක්පත්වලට ගෙවීම් කිරීමටත් මාස 06 ඉක්මවා ඇති අනෙකුත් චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායමට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සිදුකරමින් ඇත. | ප්‍රමාදයන්ගෙන් තොරව ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 110 | හානි පාඩු පිළිබඳ ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී හානි පාඩු සම්බන්ධ වාර්තා කිරීමේ ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව හානි පාඩු ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 371 | 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව එකතුව රු.80,405,752ක් වූ අත්තිකාරම් 38 ක් මුදල් රෙගුලාසි ප්‍රකාරව නිරවුල් කිරීමට 2022 මැයි 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි. | පර්යේෂණ ව්‍යාපෘති අවසන් නොවීම හේතුවෙන් ද ප්‍රාග්ධන අත්තිකාරම් කාර්යයන් අවසන් වූ විගස පියවීමට ද අනෙකුත් අත්තිකාරම් පියවා ගැනීමට ඉදිරි කටයුතු සිදුකරමින් ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුය. |
| (iii) මුදල් රෙගුලාසි 571 . | වර්ෂ දෙක ඉක්මවූ එකතු වටිනාකම රු.20,664,876 ක් වූ ටෙන්ඩර් තැන්පතු හා ආරක්ෂණ තැන්පතු සහ වසර 5 කට වැඩි කාලයක් ගතවූ එකතුව රු.23,221,500 ක් වූ පුස්තකාල තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ටෙන්ඩර් හා ආරක්ෂණ තැන්පතු නිදහස් කිරීම සඳහා ඉල්ලීම් සිදුකළ තැන්පත් කරුවන්ට කඩිනමින් නිදහස් කිරීමටත් පුස්තකාල තැන්පතු අයවීම් මුදල් ආපසු ගෙවීමටත් ඉල්ලීම් නොකළ තැන්පතු ආදායමට ගැනීමටත් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශිෂ්‍යත්ව, ත්‍යාග හා වෙනත් අරමුදල් 53 ක මුදල් ආයෝජනය කිරීමෙන් වර්ෂ ගණනාවක් සිට උපයා තිබූ ආදායමෙන් එකතුව රු.11,286,893 ක පොලී ආදායමක් සමාලෝචිත වර්ෂයේ | අදාළ අධ්‍යයන වර්ෂය තුළ එක් එක් ශිෂ්‍යත්වයට අදාළ නිර්ණායක සිසුන් විසින් ලඟා කර නොගන්නා අවස්ථාවලදී හෝ ශිෂ්‍යත්ව පිරිනැමීම වෙනුවෙන් අධ්‍යයන අංශ හා පීඨවලින් ඉල්ලීම් ඉදිරිපත් නොවන අවස්ථාවලදී ශිෂ්‍යත්ව පිරිනැමීම සිදු කරනු නොලැබේ. | ශිෂ්‍යත්ව ලබාදීමට හැක්වන පරිදි අරමුණු කාලීනව සමාලෝචනය කර අදාල මුදල් උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය. |

දෙසැම්බර් 31 දින දක්වාම අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.115,872,244ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.409,245,685ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.293,373,441ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට 2020 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර ආදායම් රු.130,369,985 කින් අඩු වීමත් පුද්ගල පඩිනඩි වියදම රු.178,121,927 කින් වැඩිවීමත් මූලික වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති අනුග්‍රහය යටතේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 3690 කින් විශ්වවිද්‍යාලයේ පරිගණක තාක්ෂණ පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකෙරෙමින් පැවතුණි. එම ගොඩනැගිලි සංකීර්ණය ඉදිවෙනතුරු එම පීඨය විශ්වවිද්‍යාලය තුළ පවත්වාගෙන යාමේදී මතු වූ අභ්‍යන්තර ගැටලු හේතුවෙන් 2019 ජනවාරි සිට කුලී ගොඩනැගිල්ලක එම පීඨය පවත්වාගෙන යාමට සිදුවීම නිසා එදින සිට 2022 ජනවාරි දක්වා එකතුව රු.100,194,000 ක් ගොඩනැගිලි කුලිය ලෙස ගෙවා තිබුණි. විශ්වවිද්‍යාලයේ පවතින ගොඩනැගිලි තුළින් කාලීනව පහසුකම් කළමනාකරණය කරගැනීමට අවධානය යොමු නොකිරීම නිසා විශාල මුදලක් කුලී ලෙස ගෙවීමට සිදුවී තිබුණි | ගොඩනැගිලි සංකීර්ණය සාදා නිම කරන තෙක්, වානිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ සහ විද්‍යා පීඨය සතු ගොඩනැගිල්ලක තාවකාලිකව දේශන පැවැත්වීමට සැලසුම් කළද එම පීඨවල ඉඩ පහසුකම් වල අවශ්‍යතාවන් වැඩිවීම මත සැලසුම් කළ පරිදි අභ්‍යනතරව දේශන හා ප්‍රායෝගික පංති පැවැත්වීමට නොහැකි වීම සහ ඇති වූ අඛණ්ඩ සිසු උද්ඝෝෂණ නිසා අධ්‍යයන කටයුතු ක්‍රමාණුකූලව කරගෙන යාමට පිළියමක් වශයෙන් පීඨය තාවකාලිකව කුළී පදනමට ලබා ගත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යැමට කටයුතු කර ඇත. | රජයේ මුදල් ආර්ථිකමය වශයෙන් ඵලදායී ලෙස කළමනාකරණය කර වියදම් අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ)කැලණිය විශ්වවිද්‍යාලයේ 60 වන සංවත්සරය වෙනුවෙන් 2019 වසරේදී මිලදී ගත් රු.2,216,085 ක් වටිනාකමැති භාණ්ඩ වර්ග 09 ක අයිතම 4088 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ගබඩාව තුළ පැවතුණි. | 2022 මැයි 30 දිනට තවදුරටත් රු.1,804,335ක් වටිනා භාණ්ඩ වර්ග 7 ක අයිතම 2,853 ක් ගබඩාව තුළ ඇත. | අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන මිලදී ගැනීම් සිදුකිරීමටත් රජයේ මුදල් ඵලදායීව උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 වර්ෂයේදී පර්යේෂණ කාර්යයන් 25 ක් ඉටුකිරීම සඳහා රු.7,714,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු නමුත් ඉන් පර්යේෂණ කාර්යයන් 14 ක් ආරම්භ කර නොතිබීම හේතුවෙන් රු6,489,479 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. 2018 වර්ෂයේදී ආරම්භකර 2021 වර්ෂය වන විට නිමකළයුතු පර්යේෂණ කාර්යයන් 06 ක් සඳහා රු737,403 ක් ලබාදී තිබුණු නමුත් 2021 දෙසැම්බර් 31 දින දක්වාම දින දිර්ඝ කිරීම් ලබාගෙන පර්යේෂණ සම්පූර්ණ නොතිබුණි. | මෙම පර්යේෂණ ව්‍යාපෘති නිම කිරීම සඳහා කාල සීමාව වසර තුනක් දක්වා ලබාගත හැකි බැවින් ඉදිරියේදී මෙම පර්යේෂණ ව්‍යාපෘති සම්පූර්ණ කරනු ඇත. කාලය දීර්ඝ කරගෙන තිබුණු පර්යේෂණ කාර්යයන් 06 සඳහා සිහි කැඳවීම් යවා ඇත. | පර්යේෂණ සඳහා වෙන්කර ඇති මුදල් උපරිම වශයෙන් උපයෝජනය කලයුතු අතර නියමිත කාලය තුළ පර්යේෂණ නිමකර එහි ප්‍රතිඵල ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2021වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙන් 2012 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව යල්පැනගිය හා අලාභහානි ලෙස හඳුනාගෙන තිබුණු පිරිවැය රු.4,204,684 ක් වූ පාරිභෝගික ද්‍රව්‍ය අයිතම 187 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව මිලදී ගැනීම් සිදුකර තිබීම හේතුවෙන් පිරිවැය රු.4,013,155 ක් වූ තොග අයිතම 446 ක් සෙමින් චලනය වන හා නිකුත් නොවන තොග ලෙස පැවතුණි. තවද අතිරික්ත තොග ලෙස පැවති පිරිවැය රු.1,108 ,577 ක් වූ තොග අයිතම179 ක් පොත් වලට ගැනීමටකටයුතු කර | ඌන තොග, අතිරික්ත තොග, සෙමින් චලනය වන තොග, නිකුත් නොවන තොග, අලාභ හානි වූ යල් පැනගිය තොග ඇතිවීමට හේතු මුදල් කමිටුව වෙත ඉදිරිපත් කර ඇති අතර එම කමිටු නිර්දේශ මත අදාළ නිවැරදි කිරීම් කටයුතු කරනු ලැබේ. | අවශ්‍යතාවය හඳුනාගෙන තොග මිලදී ගැනීමට කටයුතු කලයුතුය. එසේම අතිරික්ත තොග පොත් වලට ගැනීමටත් ඌන තොග සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කල යුතුය. |

නොතිබුණු අතර ඌන තොග ලෙස හඳුනාගෙන තිබුණු පිරිවැය රු 970236 ක් වූ තොග අයිතම 91 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පවත්නා පරිගණක මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉඩපහසුකම් ප්‍රමාණවත් නොවීම නිසා රු.මිලියන 165 ක් වැයකර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානයක් වසර 2 කදී ඉදිකිරීම සඳහා 2016 වර්ෂයේදී පුද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු වෙත ලබාදී තිබුණද 2021 දෙසැම්බර් 31 දින වනවිටත් අදාල ඉදිකිරීම සම්පූර්ණ කර නොතිබුණි. | යෝජිත ගොඩනැගිල්ල සිසුන්ගේ විරෝධතා හේතුවෙන් යෝජිත ස්ථානයේ ඉදිකිරිමට නොහැකි වූ අතර නැවත ඉඩමක් මිලදී ගැනීමට බොහෝ කාලයක් ගත වූ බැවින්ද කොන්ත්‍රාත්කාර රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ පැවති මූල්‍ය අර්බුදයද මෙම ප්‍රමාදයට හේතුවී ඇත. | නොපමාව ඉදිකිරීම් කාර්යයන් සම්පූර්ණ කරවාගෙන අරමුණු සඳහා යොදවා ගත යුතුය. |